# වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ මාධ්‍ය අංශය සඳහා තාවකාලික පදනමින් පත් කිරීමට නියමිත පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**තනතුර : ඡායාරූප ශිල්පී සහායක**

**තනතුරු සංඛ්‍යාව : 01**

| | | |
|---|---|---|
| තනතුරේ ස්වභාවය | : | තාවකාලික |
| වැටුප | : | මාසික දීමනාව රු. 24,250/- සහ රු. 7,800/- කින් යුත් ජීවන වියදම් දීමනාවකි. |
| අධ්‍යාපන සුදුසුකම් | : | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම. |
| වෘත්තීය සුදුසුකම් | : | අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |
| පළපුරුද්ද | : | තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ. |
| වයස | : | අවු. 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| බඳවාගැනීමේ ක්‍රමය | : | යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් උපරිම සුදුසුකම්ලත් තැනැත්තන් බඳවා ගනු ලැබේ. |

**වෙනත්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ විස්තර සහිතව පිළියෙල කරන ලද අයදුම්පත, උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමගින් ලියාපදිංචි කළ තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2022.06.27 දින හෝ ඊට පෙර එවිය යුතුය.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අත්සන් කර නොමැති අයදුම්පත් හා ඉහත සඳහන් සුදුසුකම් සහ සහතිකපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙබ් අඩවියේද පළ කර ඇත. www.portmin.gov.lk

**ලේකම්,**
**වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය,**
**නො. 19, චෛත්‍ය පාර, කොළඹ 01.**
**2022.06.10**